# ටෙන්ඩර් දැන්වීමයි
# ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව
# පිරිපහදු කාර්යාංශය

## බොරතෙල් රැස්කර තබන අංක 04 දරණ ටැංකියේ පතුල අලුත්වැඩියා කිරීම.
## ටෙන්ඩර් අංක - REF-PD/WORKS/2016/02

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ දැනට පවතින විෂ්කම්භය මීටර 67 ක් වන අංක 04 දරණ බොරතෙල් රැස්කර තබන වානේ ටැංකියේ පතුල ඒ.පී.අයි.650/653 ප්‍රමිතියට අනුව නැවත ඉදිකිරීම සඳහා දේශීය හා ජාත්‍යන්තර ඉදිකිරීම් කරුවන්ගෙන් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණකර ඇති ටෙන්ඩර් කරුවන්ට ලංසු තැබීම සඳහා ආරාධනා කරනු ලැබේ.

1. දේශීය ඉදිකිරීම්කරුවෙක් නම් පසුගිය වසර 05 තුල මෙවැනි තෙල් රැස්කර තබන වානේ ටැංකි ඒ.පී.අයි.650/653 ප්‍රමිතියට අනුව ඉදිකිරීම හෝ අලුත්වැඩියා කිරීම පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතු අතර ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනයේ (ICTAD) EM1 ශ්‍රේණි මට්ටමේ ලියාපදිංචිය තිබිය යුතුය.

2. විදේශීය ඉදිකිරීම්කරුවෙක් නම් පසුගිය අවුරුදු 05 ඇතුලත මෙවැනි විශාල එක් ටැංකියක් වත් ඒ. පී. අයි 650/653 ප්‍රමිතියට අනුව ඇමරිකානු ඩොලර් ලක්ෂ අටකට නොඅඩු ගනනකට ඉදිකල බවට හෝ අලුත්වැඩියාකල බවට ලේඛන ගත සාධක තිබිය යුතුය.

3. විදේශිය සමාගමක් දේශිය ලියාපදිංචි සමාගමක් සමග සහයෝගීතාවයෙන් කටයුතු කරන අවස්ථාවකදි විදේශීය සමාගම පසුගිය වසර 05 ක කාලයක් තුල අවම වශයෙන් ඇමරිකානු ඩොලර් ලක්ෂ අටකට නොඅඩු වටිනාකමින් යුතු එක් යාන්ත්‍රික ඉංජිනේරුමය ඉදිකිරීමක් නිමකර තිබීම හා අවම වශයෙන් එක් පාර්ශවයක්වත් ඒ.පී.අයි. 650 ප්‍රමිතිය අනුව එක් වානේ ටැංකියක්වත් ඉදිකර තිබීම අවශ්‍ය වේ.

ඉහත අවශ්‍යතා සම්පූර්ණ කර ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත්කිරීමෙන් පසු ටෙන්ඩර් ලියකියවිලි නිකුත්කරනු ලැබේ.

ටෙන්ඩර් ලියකියවිලි ලබාගැනීම සඳහා ආපසු ගෙවනු නොලබන රුපියල් 12,500/= ක ටෙන්ඩර් තැන්පතුවක් පිරිපහදු මුදල් අංශයට ගෙවිය යුතුය.

ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලබන අවසාන දිනය 2017-09-25 වෙනි දින 15.00 පැය දක්වා වන අතර, මුද්‍ර තබන ලද ටෙන්ඩර්පත් 2017-10-12 වෙනි දින 14.30 පැය දක්වා භාරගනු ලබන අතර, එදිනම 14.30 පැයට ඒවා විවෘත කරනු ලැබේ.

මෙම ටෙන්ඩරය සඳහා වන පූර්ව ටෙන්ඩර රැස්වීම 2017-09-27 දින 09.30 පැයට පිරිපහදු කාර්යාංශයේ ප්‍රධාන රැස්වීම් ශාලාවේදී පැවැත්වෙන අතර සියලුම ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට ඒ සඳහා ආරාධනා කරනු ලැබේ.

ඉහත රැස්වීමට සහභාගීවීම අනිවාර්ය වන අතර, රැස්වීමට සහභාගී නොවන ටෙන්ඩර්කරුවන්ගේ ලංසු බාරගනු නොලැබේ. මෙම රැස්වීමට සහභාගීවන වීම සඳහා වන සියලුම වියදම් ටෙන්ඩර් කරුවන් විසින් දැරිය යුතු වේ.

ටෙන්ඩර් ලියකියවිලි www ceypetco. gov. lk යන වෙබ් අඩවියෙන් පරීක්‍ෂා කල හැක.

ටෙන්ඩර් ලියකියවිලි සහ අනෙකුත් විස්තර නියෝජ්‍ය පිරිපහදු කළමණාකාර (නඩත්තු හා යෝජනා ක්‍රම), පිරිපහදු කාර්යාංශය, සපුගස්කන්ද, ශ්‍රී ලංකාව, වෙතින් ලබා ගත හැක.

ටෙලි. – 94 11 2400427 / 5668542,
ෆැක්ස් – 94 11 2400431 / 2400436

සභාපති,
ආයතනික ප්‍රසම්පාදන කමිටුව,
ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව,
පිරිපහදු කාර්යාංශය,
සපුගස්කන්ද,
ශ්‍රී ලංකාව.